## 2.27 බටහිර දර්ශනය කෙරෙහි ෂෝපන්හවර්ගේ සර්වාශුභවාදයේ බලපෑම

**මනෝජ් සුචරිකා හරිස්චන්ද්‍ර**
**දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.**

## ABTRACT

දර්ශන ඉතිහාසය දෙස බලන කල 19 වෙනි ශතවර්ෂයෙහි බුද්ධිමය සාකච්ඡාවන් ඉන් පෙර කිසිදු යුගයක නොපැවති තරම් සංකීර්ණ බව දක්නට ලැබේ. එකල සිටි දාර්ශනිකයන් අතර කාන්ට්, හෙගල් තරමට ප්‍රසිද්ධ නොවූව ද ෂෝපන්හවර් ද ඉතා වැදගත් කාර්යභාරයක් සිදුකළ ජර්මන් ජාතික දාර්ශනිකයෙක් වශයෙන් හඳුන්වා දිය හැක. 1788 පෙබරවාරි මස 22 වන දින උපත ලැබූ ෂෝපන්හවර් මුලින් විඥානවාදී දාර්ශනිකයෙක් වූ නමුදු පසුව විඥානවාදී දර්ශන සම්ප්‍රදායට එරෙහි විය. අනෙක් දාර්ශනිකයන් හා සංසන්දනය කර බලන කල ඔහු වෙනස් පිළිවෙතකින් යුත්, බොහෝ කරුණු අතින් අමුතු දාර්ශනිකයෙක් වශයෙන් සළකනු ලැබේ. මොහු සර්වාශුභවාදියෙකු වීම එයට හේතු වන්නට ඇතැයි සිතිය හැකිය. ඔහු හින්දු ආගම, බුද්ධාගම කෙරෙහි මහත් සේ ඇලුම් කළ නමුදු ක්‍රිස්තු ලබ්ධිය ප්‍රිය නොකළේය. ඔහුගේ දර්ශනය තුළ, අධිෂ්ඨානය, ට (උසකක) මූලික ස්ථානයක් ලැබුණි. එය සර්වාශුභවාදයට වඩා කැපී පෙනුනු ධර්මතාවයක් වශයෙන් ඔහුගේ දර්ශනය තුළ ප්‍රකට විය.

19 වෙනි ශතවර්ෂයේ අද්භූත සම්ප්‍රදාය ඔස්සේ ඇරඹි ෂෝපන්හවර්ගේ දාර්ශනික කාර්යභාරය දර්ශනය විෂය ක්ෂේත්‍රය තුළ නව දාර්ශනික ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් විය. ඓතිහාසික වශයෙන් සලකා බලන කල ද ෂොපන්හවරර් වැදගත් වන බව සඳහන් කළ හැකිය. එනම්, ඔහු සර්වාශුභවාදය සහ අධිෂ්ඨානය ඥානයට වඩා උසස් ලෙස සළකා තිබීමයි.

ඔහු තම දර්ශනය තුළ සත්භාවයෙහි ප්‍රමුඛතාවය බුද්ධිමය වශයෙන් දැක්වීය. එසේම සිය දර්ශනය මගින් සෞන්දර්යය, ඥාන විභාගය, ආචාරධර්ම, මනෝවිද්‍යාව, දේශපාලන විද්‍යාව ආදී ක්ෂේත්‍රයන් කරාද පිවිස තිබේ. සමකාලීන දර්ශනය සම්බන්ධව ද ඔහුගෙන් ලැබී ඇති දායකත්වය අති විශාලය. වර්තමානයේ වැඩි වශයෙන් කතා බහට ලක්වන පශ්චාත්නූතනවාදය කෙරෙහි ද ෂෝපන්හවරියානු දර්ශනය බලපෑම් කර තිබේ.